# මාසික

# විවරණිකාව

**2009 ජනවාරි**



**ශ්‍රී ලංකා මහ බැංකුව**

# ශ්‍රී ලංකා මහ බැංකුව

## විවරණිකාව

59 වැනි වෙළුම 01 වැනි කලාපය

## 2009 ජනවාරි

ශ්‍රී ලංකා මහ බැංකුවේ විවරණිකාව, මාණ්ඩලික සංස්කාරක කමිටුවක විධානයන් යටතේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාසිකව නිකුත් කරනු ලැබේ.

නිල වාර්තා හා පෞද්ගලික නම්වලින් පළ කෙරෙන ලිපි හැර, මෙහි පළවී ඇති අනෙකුත් අර්ථ කථනයන් සහ අදහස් සම්බන්ධයෙන් එම කමිටුව විසින් වගකීම දරනු ලැබේ. එසේ වුවද, මෙම අර්ථ කථනයන් සහ අදහස් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස් ලෙස පිළිගත යුතු නොවේ.

හිමිකම් ඇසුරුණු බව දක්වා ඇති අවස්ථාවන්හි දී හැර, මෙම විවරණිකාවෙහි පළවෙන ඕනෑම කරුණක් පූර්ව අනුමැතියක් නොලබා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ නැවත පළ කිරීමට හෝ පරිවර්තනය කිරීමට අවසර ඇත. එහෙත් එසේ නැවත පළ කිරීමේදී හෝ පරිවර්තනය කිරීමේ දී එම කරුණු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ විවරණිකාවෙන් උපුටා ගත් බව සඳහන් කළයුතුයි.

**ISSN 1391 - 3654**

**ප්‍රකාශය: ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ 01.**

| පටුන | පිටුව |
|---|---|
| 1 වන කොටස - මාසික සිදුවීම් ........... .......... | 06 |
| 2 වන කොටස - පුවත්පත් නිවේදන 2009 ජනවාරි ........... .......... | 07 |
| 1. මාස 18 ක් තුළ උද්ධමනයෙහි පහළම අගය 2008 දෙසැම්බර් මාසයේ දී .......... | 08 |
| 2. 2008 නොවැම්බර් මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරීත්වය ......... .......... | 09 |
| 3. භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළ විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන් සහ විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා විවෘත කිරීම .......... | 09 |
| 4. මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය - 2009 ජනවාරි .......... ........... | 10 |
| 5. සුනාමියෙන් හානියට පත් සංචාරක අංශයේ ව්‍යාපෘති සඳහා සහන සැලසීම | 11 |
| 6. රුපියල අව ප්‍රමාණය වීම හෝ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් අරමුදල් ලබාගැනීම (Currency devluation or IMF bailout) යටතේ 2009 ජනවාරි මස 18 වන දින මාධ්‍යවල පළවූ ලිපි පිළිබඳව කරනු ලබන පැහැදිලි කිරීම ............ | 11 |
| 7. 2008 වසරේ නොවැම්බර් මස අවසානයේදී පැවැති විදේශ සංචිත තත්ත්වය පිළිබඳ පැහැදිලි කිරීම ............. ........... | 12 |
| 8. නේවාසික සහ අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු සඳහා පොලිය මත රුපියල් වලින් ප්‍රසාද දීමනාවක් ගෙවීම ............ | 13 |
| 9. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකා ඛනිජ තෙල් සංස්ථාව හා වාණිජ බැංකු කීපයක් සමඟ ගන්නා ලද ඉදිරි සුරැකුම් ගිවිසුම් පිළිබඳව නිකුත් කරනු ලැබූ විධානයන් ........... | 13 |
| 10. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (CCPI) ......... ........... | 14 |
| 3 වන කොටස - මහජනතාවගේ දැනගැනීම සඳහා 2009 ජනවාරි .......... ........... | 15 |
| 1. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය සහ අධීක්ෂණය කරනු ලබන මූල්‍ය ආයතන .......... | 15 |
| 2. නීති විරෝධී පිරමිඩාකාර යෝජනා ක්‍රම පිළිබඳ පැහැදිලි කිරීමේ නිවේදනයයි ........... | 16 |
| 3. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය සහ අධීක්ෂණය කරනු ලබන මූල්‍ය ආයතන .......... | 18 |

| සංඛ්‍යා ලේඛන පරිශිෂ්ටය | සංඛ්‍යා සටහන් |
|---|---|
| **නිෂ්පාදනය, වර්ෂාපතනය, යෙදවුම් සහ ආයෝජනය** | |
| දළ දේශීය නිෂ්පාදිතය හා දළ ජාතික නිෂ්පාදිතය ........... ........ ......... | 01 |
| කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශක .......... ......... .......... | 02 |
| තේ, රබර් සහ පොල් නිෂ්පාදනය .......... ........ ........ | 03 |
| වී නිෂ්පාදනය .......... ......... ......... | 04 |
| වර්ෂාපතනය සහ වැසි දින ගණන් ප්‍රමාණය .......... ......... ......... | 05 |
| පොහොර නිකුතුව .......... ......... ......... | 06 |
| තෝරාගත් කාර්මික නිෂ්පාදන දර්ශක ......... ........ ......... | 07 |
| පෞද්ගලික අංශයේ කර්මාන්ත නිෂ්පාදන ප්‍රමාණ දර්ශකය ......... ......... | 08 |
| ආයෝජන මණ්ඩල ව්‍යවසායන්හි ආයෝජන, අපනයන සහ සේවා නියුක්තිය ......... ......... | 09 |
| **පණිවුඩ හුවමාරුව, බලශක්තිය ප්‍රවාහන සහ නිවාස** | |
| විදුලි සංදේශ සේවා ......... ......... ......... | 10 |
| විදුලිබල උත්පාදනය සහ ඛනිජ තෙල් ආනයනය ......... ......... ......... | 11 |
| මගී ප්‍රවාහනය සහ වරාය ක්‍රියාකාරීත්වය ......... ......... .......... | 12 |
| මෝටර් රථ නව ලියාපදිංචි කිරීම් ......... ......... .......... | 13 |
| මහ කොළඹ නිවාස අනුමත කිරීමේ දර්ශකය ........ ......... ......... | 14 |
| **මිල සහ වැටුප්** | |
| කොළඹ දිස්ත්‍රික්කයේ පාරිභෝගික මිල දර්ශකය ......... ......... ......... | 15 |
| තොග අලෙවි මිල දර්ශකය ......... ......... ........ | 16 |
| තෝරාගත් ආහාර ද්‍රව්‍ය කිහිපයක පිටකොටුව වෙළෙඳපොළෙහි තොග මිල ගණන් ......... | 17 |
| තෝරාගත් ආහාර ද්‍රව්‍ය කිහිපයක නිෂ්පාදන සහ සිල්ලර මිල ගණන්වල සාමාන්‍යය ......... | 18 |
| තෝරාගත් එළවළු, මාළු, පලතුරු හා කුකුළු ගොවිපල නිෂ්පාදන වර්ග කිහිපයක සාමාන්‍ය නිෂ්පාදන මිල ගණන් ........ ......... ......... | 19 |
| තෝරාගත් එළවළු සහ මාළු වර්ග කිහිපයක සාමාන්‍ය සිල්ලර මිල ගණන් .......... ......... | 20 |
| උපයෝගි සේවා මිල ගණන් ......... ......... ......... | 21 |
| පඩි පාලක සහා කම්කරුවන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශක අංක....... ......... ......... | 22 |
| රජයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශක අංක .......... ......... .......... | 23 |
| මුළු දිවයිනේ අසංවිධිත අංශයේ දෛනික වැටුප් . ......... .......... .......... | 24 |
| ඉදිකිරීම් පිරිවැය දර්ශක .......... ......... .......... | 25 |
| තෝරාගත් ඉදිකිරීම් යෙදවුම් කිහිපයක මිල දර්ශක සහ කම්කරු වැටුප් දර්ශක .......... ......... | 26 |

## රාජ්‍ය මූල්‍ය කටයුතු


| | | | | |
|---|---|---|---|---|
| ශුද්ධ මුල්‍ය අතිරික්තය (+)/හිඟය (-) | .......... | .......... | .......... | 27 |
| රජයේ ආදායම | .......... | .......... | .......... | 28 |
| රජයේ වියදම - 2008 | .......... | .......... | .......... | 29 |
| රජයේ වියදම | .......... | .......... | .......... | 30 |
| නොපියවූ රාජ්‍ය ණය | .......... | .......... | .......... | 31 |


## වෙළෙඳාම, ගෙවුම් තුලනය සහ සංචාරක ව්‍යාපාරය


| | | | | |
|---|---|---|---|---|
| අපනයන, ආනයන සහ වෙළෙඳ ශේෂය | .......... | .......... | .......... | 32 |
| අපනයන | .......... | .......... | .......... | 33 |
| කාර්මික සහ ඛනිජමය අපනයන සංයුතිය | .......... | .......... | .......... | 34 |
| තේ සහ රබර් - වෙන්දේසි සහ අපනයන | .......... | .......... | .......... | 35 |
| ප්‍රධාන පොල් නිෂ්පාදන - වෙන්දේසි සහ අපනයන | .......... | .......... | .......... | 36 |
| අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන අපනයන - ප්‍රමාණය | .......... | .......... | .......... | 37 |
| අනෙකුත් කෘෂි නිෂ්පාදන අපනයන-වටිනාකම | .......... | .......... | .......... | 38 |
| ආනයන සංයුතිය. | ........... | ........... | .......... | 39 |
| මහ බැංකුවේ වෙළෙඳ දර්ශක - අපනයන වටිනාකම | .......... | .......... | .......... | 40 |
| මහ බැංකුවේ වෙළෙඳ දර්ශක - ආනයන වටිනාකම | .......... | .......... | .......... | 41 |
| මහ බැංකුවේ වෙළෙඳ දර්ශක - අපනයන පරිමාව | .......... | .......... | .......... | 42 |
| මහ බැංකුවේ වෙළෙඳ දර්ශක - ආනයන පරිමාව | .......... | .......... | ........... | 43 |
| මහ බැංකුවේ වෙළෙඳ දර්ශක - අපනයන ඒකක වටිනාකම......... | | ........... | ........... | 44 |
| මහ බැංකුවේ වෙළෙඳ දර්ශක - ආනයන ඒකක වටිනාකම.......... | | ........... | .......... | 45 |
| සංචාරක කර්මාන්තයේ මූලික දර්ශක | .......... | ........... | .......... | 46 |
| ගෙවුම් තුලනය - (රු.දශලක්ෂ) | .......... | .......... | .......... | 47 |
| ගෙවුම් තුලනය - (එ.ජ.ඩො. දශලක්ෂ) | .......... | .......... | .......... | 48 |
| විදේශීය සංචිත | .......... | .......... | .......... | 49 |
| ප්‍රධාන ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතික සහ නාමික සඵල විනිමය අනුපාතික සහ මූර්ත සඵල විනිමය අනුපාතිකවල මාසික දර්ශක අගයන් ..... | | | .......... | 50 |
| අන්තර් බැංකු ඉදිරි වෙළෙඳපොළ ගණුදෙනු | .......... | .......... | ........... | 51 |


## මූල්‍ය අංශය


| | | | | |
|---|---|---|---|---|
| මූල්‍ය සමස්තයන් ($M_2$) | .......... | .......... | .......... | 52 |
| මූල්‍ය සමීක්ෂණය (දේශීය බැංකු ඒකක) | .......... | .......... | .......... | 53 |
| මහ බැංකුවේ වත්කම් සහ වගකීම් | .......... | ........... | .......... | 54 |
| වාණිජ බැංකුවල වත්කම් සහ වගකීම් | .......... | .......... | .......... | 55 |
| විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි (වි.ව්‍ය.ම.බැ..ඒ.) වත්කම් සහ වගකීම් ...... | | | .......... | 56 |
| ඒකාබද්ධ මූල්‍ය සමීක්ෂණය (වි.ව්‍ය.මු.බැ..ඒ. ඇතුළත්ව) | ......... | .......... | .......... | 57 |
| මූල්‍ය සමීක්ෂණය - ($M_4$) | .......... | .......... | .......... | 58 |
| වාණිජ බැංකුවල සංචිත තත්ත්වය. | .......... | .......... | .......... | 59 |
| මහ බැංකුවේ ව්‍යවහාර මුදල් නිකුතුව (වටිනාකම අනුව) | .......... | .......... | .......... | 60 |
| මුදල් අනුපාතික | .......... | .......... | .......... | 61 |
| රජයේ සුරැකුම්වල ඵලදා අනුපාතික. | .......... | .......... | .......... | 62 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු නොවන මූල්‍ය ආයතනයන්හි තැන්පතු සහ ණය ලබාදීමේ අනුපාතික .......... | | | | 63 |
| බලපත්‍රලාභී වාණිජ බැංකුවල පොළී අනුපාතික. | .......... | .......... | .......... | 64 |
| බලපත්‍රලාභී වාණිජ බැංකුවල ගාස්තු සහ මුදල් අය කිරීම් | .......... | .......... | .......... | 65 |
| චෙක්පත් නිශ්කාෂණය සහ ශ්‍රී ලංකා මහ බැංකු ගෙවීම් පද්ධතිය | | .......... | .......... | 66 |
| වාණිජ බැංකු හර සහ තැන්පතු පිරිවැටුම් | | .......... | .......... | 67 |
| වාණිජ බැංකු වෙතැති පෞද්ගලික අංශයේ ඉල්ලුම්, කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු අයිතිය | | | ........... | 68 |
| අරමුණු සහ කල්පිරීමේ රටාව අනුව වර්ග කරන ලද වාණිජ බැංකු ණය සහ අත්තිකාරම් | | | ........... | 69 |
| ජාතික සංවර්ධන බැංකුවේ ඩී.එෆ්.සී.සී. බැංකුවේ සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මූල්‍ය කටයුතු | | | | 70 |
| වාණිජ බැංකු සහ අනෙකුත් වාණිජ බැංකු නොවන බලපත්‍රලාභී මූල්‍ය ආයතනවල ඉතිරිකිරීම් සහ ස්ථාවර තැන්පතු | .......... | .......... | .......... | 71 |
| කොටස් වෙළෙඳපොළ කටයුතු | .......... | .......... | ......... | 72 |

## 1 වන කොටස

# මාසික සිදුවීම්

## 2008 ජනවාරි

### රාජ්‍ය මූල්‍ය අංශය

- බැංකු හා මූල්‍ය ආයතන හැර ආනයන, නිෂ්පාදන සහ අනෙකුත් සේවා සපයන ආයතනවල විකුණුම් මත සියයට 1 ක ජාතිය ගොඩනැගීමේ බද්දක් වසර දෙකක කාලයක් සඳහා පනවන ලදී.

- සාමාන්‍ය එකතු කළ අගය මත බද්ද සියයට 15 සිට සියයට 12 දක්වා අඩු කරන ලදී.

- එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වීමේ පිරිවැටුම් සීමාව, බදු කාල පරිච්ඡේදයකට රුපියල් 650,000 ක් හෝ වර්ෂයකට රුපියල් දශ ලක්ෂ 2.5 ක් දක්වා වැඩි කරන ලදී.

- එකතු කළ අගය මත විකල්ප බද්ද සඳහා ලියාපදිංචි වීමේ පිරිවැටුම් සීමාව රුපියල් දශ ලක්ෂ 3 දක්වා වැඩි කරන ලදී.

- දේශීයව නිෂ්පාදනය කරනු ලබන ශල්‍ය කර්ම සඳහා භාවිතා වන ගෝස් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.

- සියයට 20 සුඛෝපභෝගී බදු අනුපාතයට අදාළ එකතු කළ අගය මත බදු සඳහා වන ප්‍රතිදාන ලබාගැනීමේ හැකියාව සියයට 15 සිට සියයට 12 දක්වා අඩු කරන ලදී.

- ප්‍රජා දායකත්වයෙන් සිදු කරනු ලබන ගම නැගුම, මග නැගුම සහ ප්‍රජා වාරිමාර්ග ව්‍යාපෘති හා සම්බන්ධ ඉදිකිරීමේ කටයුතු, එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.

- ජංගම හා රැහැන් රහිත දුරකථන සඳහා අදාළ වන සියයට 10 දුරකථන ග්‍රාහක බද්ද ස්ථාවර දුරකථන සඳහා අදාළ වන පරිදි දීර්ඝ කරන ලදී.

- ත්‍රස්තවාදී කටයුතු හේතුවෙන් විනාශ වූ බස් රථ වෙනුවෙන් නව බස් රථ ආනයනය කිරීම 2008 ජූලි මස 09 වන දින හෝ ඊට පසුව සිදුකර ඇත්නම් ඒවා එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.

- ජාතික ශිල්ප සභාව විසින් ආනයනය කරනු ලබන පිත්තල තහඩු, පිත්තල කුට්ටි, නූල්, සායම්, පැරපින් ඉටි සහ සකස් කළ ඉටි ආනයනය, එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.

- සූර්ය බලය උත්පාදනය සඳහා ආනයනය කරනු ලබන තෝරාගත් සූර්ය බලශක්ති පද්ධති සහ උපාංග ආනයනය කිරීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.

- විදුලිබලය ජනනය කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයට සැපයීමට ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් රසායනික නැප්තා ආනයනය කිරීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.

- ආනයනය කරනු ලබන භාණ්ඩ මත රේගුවේදී ගෙවනු ලබන එකතු කළ අගය මත බදු සඳහා රේගු ප්‍රකාශය මත බදු ප්‍රතිදාන ඉල්ලා සිටිය හැකි කාල සීමාව වර්ෂ දෙකක් දක්වා දීර්ඝ කරන ලදී.

- රජයේ සේවකයන්ගේ ජීවන වියදම් දීමනාව අවම වශයෙන් රුපියල් 1000 කින් වැඩි කරන ලදී.

- විශ්‍රාමිකයන්ගේ ජීවන වියදම් දීමනාව මසකට රුපියල් 560 කින් වැඩිවන ලෙස රු. 2000/- ක් දක්වා වැඩි කරන ලදී.

- වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද සියයට 3 සිට සියයට 5 දක්වා වැඩිකරන ලදී.

- සමහර වර්ගවල ඛනිජ තෙල් සහ බිටුමිනස්, ඛනිජ වලින් ලබා ගන්නා තෙල්, බොර තෙල් , කාබනික රසායන, ඖෂධ සහ කොළ මඩින යන්ත්‍ර, ලනු අඹරන යන්ත්‍ර, ගොතන මැෂින්, මහන මැෂින් සහ රෙදි මදින යන්ත්‍ර යනාදි යන්ත්‍ර සඳහා සියයට 2 ක සහනදායි වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු අනුපාතිකයක් පනවන ලදී.

- තෝරාගත් වර්ගවල දියමන්ති, වටිනා දියමන්ති රිදී රත්‍රන් හා ප්ලැටිනම් ආදිය වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී.

- කිරිපිටි ආනයනය සඳහා වන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද සියයට 145 සිට සියයට 35 දක්වා වැඩි කරන ලදී.

### වෙනත්

- මගී ප්‍රවාහන බස් ගාස්තු 4% කින් පහත දමන ලදී. සංචාරක හෝටල් සහ කර්මාන්ත සඳහා, විදුලිබල මණ්ඩලය විසින් අයකරන ලද ඉන්ධන ගැලපුම් ගාස්තුව 2009 ජනවාරි සිට නොවැම්බර් මාසය දක්වා ඉවත් කරන ලදී.

### ජපාන රජයෙන් ලැබුණු ප්‍රදාන

- අනුරාධපුර අභ්‍යාස රෝහල (අදියර) වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් යොදා ගැනීමට ජපානයෙන් දශ ලක්ෂ 390 (දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 493) ක ප්‍රදානයක් සඳහා ශ්‍රී ලංකා රජය සහ ජපාන රජය අතර ගිවිසුමකට 2009 ජනවාරි මස 29 වැනි දිනදී අත්සන් තබන ලදී.

### එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනෙන් ලැබුණු ප්‍රදාන

- මොන්ට්‍රියල් ගිවිසුම යටතේ ඕසෝන් ස්ථරය පළුදු කිරීම මැඩ පැවැත්වීමට ආයතනික වශයෙන් ශක්තිමත්වීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් යොදා ගැනීමට එ.ජ.ඩොලර් දශ ලක්ෂ 0.13 (දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 15) ක ප්‍රදානයක් සඳහා ශ්‍රී ලංකා රජය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන අතර ගිවිසුමකට 2009 ජනවාරි 02 වැනි දිනදී අත්සන් තබන ලදී.

# 2 වන කොටස

# පුවත්පත් නිවේදන

## 2009 ජනවාරි


### 1. මාස 18 ක් තුළ උද්ධමනයෙහි පහළම අගය 2008 දෙසැම්බර් මාසයේ දී

*කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙහි (කො.පා.මි.දර්ශකය) (2002=100) ලක්ෂ්‍යමය වෙනස මත පදනම්ව මනිනු ලබන උද්ධමන අනුපාතය හයවන මාසයටත් අඛණ්ඩව අඩු වෙමින්, 2008 දෙසැම්බර් මාසය වන විට සියයට 14.4 ක් දක්වා පහළ වැටිණි. මෙය 2007 ජූලි මස සිට 2008 දෙසැම්බර් මස දක්වා වූ මාස 18 ක කාලපරාසයක් තුළ වාර්තා කළ අඩු ම අගය වේ. වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතය ද දෙවැනි වරටත් අඛණ්ඩව අඩු වෙමින් 2008 දෙසැම්බර් මාසය වන විට සියයට 22.6 ක අගයක් වාර්තා කළේය. තවද, කො.පා.මි. දර්ශකයේ භාණ්ඩ පැසෙහි ආහාර නොවන සහ බලශක්ති නොවන අයිතමයන්ගේ මිල වෙනස් වීම් මනිනු ලබන මූලික උද්ධමනයෙහි ලක්ෂ්‍යමය වෙනස ද, පූර්ව මාසයේ අගය වූ සියයට 18.1 සිට සියයට 15.7 දක්වා වූ කැපී පෙනෙන අඩු වීමක් පෙන්නුම් කර තිබිණි.*

2008 ජූනි මාසයේ දී වාර්තා කළ සියයට 28.2 ක ඉහළ ම අගයක සිට අඛණ්ඩව අඩු වෙමින් 2008 නොවැම්බර් මාසයේ දී සියයට 16.3 ක් දක්වා ළඟා වූ මතුපිට උද්ධමන අනුපාතය, 2008 දෙසැම්බර් මාසයේදී තවදුරටත් සැලකිය යුතු ලෙස පහත වැටුණි. ඒ අතර ම, මාසික මිල දර්ශකයට අනුව 2008 දෙසැම්බර් මාසයේ සාමාන්‍ය මිල මට්ටම පූර්ව මාසය හා සසඳන විට සියයට 0.7 ක සුළු අඩු වීමක් දක්වයි. මෙම අඩු වීම සඳහා ප්‍රවාහනය (සියයට 7.0) සහ නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන (සියයට 1.1) යන උප කාණ්ඩවල මිල පහළ යෑම හේතු වී ඇත.

මූලික උද්ධමනයේ ලක්ෂ්‍යමය වෙනස පූර්ව මාසයේ පැවති සියයට 18.1 සිට සියයට 15.7 දක්වා පහත වැටුණ නමුත් වාර්ෂික සාමාන්‍යයෙහි සියයට 13.0 සිට සියයට 13.6 දක්වා සුළු ඉහළ නැගීමක් දක්නට ලැබිණි. ප්‍රවාහනය (සියයට 0.2) සහ මධ්‍යසාර නොවන බීම වර්ග (සියයට 0.2) යන උප කාණ්ඩවල මිල ගණන් පහළ යෑම මාසික මූලික උද්ධමන දර්ශකය සියයට 0.7 කින් අඩු වීමට හේතු විය.

පසුගිය කාලය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කළ දැඩි මුදල් ප්‍රතිපත්ති හේතුකොටගෙන මිල මත ඉල්ලුමෙන් ඇති කරන ලද පීඩනය අඩු වීමත්, සැපයුම් අංශයේ වාසිදායක වර්ධනයන්හි බලපෑමත්, බාහිර කම්පනයන්ගෙන් ඇති විය හැකි බලපෑම් අඩු වීමත් නිසා ඉදිරි කාල පරිච්ඡේදය තුළ උද්ධමන අනුපාතය තවදුරටත් අඩු වෙමින් 2009 වසරෙහි මුල් කාලයේ දි එය තනි අංකයක් කරා ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ.



## 2. 2008 නොවැම්බර් මාසයේ විදේශ වෙළෙඳමේ ක්‍රියාකාරීත්වය

*ගෝලීය ආර්ථික පසුබැසීමත් සමග වූ අයහපත් ප්‍රතිඵල හමුවේ වුවද, පෙර වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය සමග සසඳන විට 2008 නොවැම්බර් මාසයේ දී අපනයන සියයට 11.6 කින් වර්ධනය වූ අතර අපනයන ආදායම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 645 ද් ලෙසින් වාර්තා විය. මේ සඳහා විශේෂයෙන්ම රෙදිපිළි හා ඇඟළුම් අපනයන සියයට 22.6 කින් ඉහළ යාමත් සමග සියයට 18.7 කින් ඉහළ ගිය කාර්මික අපනයන ප්‍රධාන වශයෙන් දායක විය. මෙම රෙදිපිළි හා ඇඟළුම් ප්‍රමාණයෙන් සියයට 41 ක් ඇමෙරිකා එක්සත් ජනපදයටත් සියයට 27 ක සැලකිය යුතු ප්‍රමාණයක් එක්සත් රාජධානියටත්, සියයට 23 ක් අනෙකුත් යුරෝපා රටවලටත් අපනයනය කර ඇත. පෙර වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය සමග සසඳන විට කාර්මික අපනයන අතුරින් ආහාර, පාන වර්ග සහ දුම්කොළ මෙන්ම දියමන්ති හා ස්වර්ණාභරණ සැළකිය යුතු ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කර ඇත. කෙසේ වුවත්, භාණ්ඩ හා සේවා සඳහා ජාත්‍යන්තර ඉල්ලුම අඩුවීම හේතුවෙන්, පෙර වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය සමග සසඳන විට 2008 නොවැම්බර් මාසයේ දී යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ඇතුළුව අනෙකුත් උප අංශයන් බොහොමයක වර්ධනය පහත වැටී ඇත.*

තේ සහ රබර් යන අංශවල මතු වූ අර්බුද හේතුවෙන් පෙර වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය සමග සසඳන විට 2008 නොවැම්බර් මාසයේ දී කෘෂිකාර්මික අපනයන සියයට 8.1 කින් පහත වැටුණි. අන්තර් ජාතික වෙළෙඳපොළ තුළ මිල පහත වැටීම නිසා තේ අපනයන ආදායම සියයට 10.8 කින් විශාල වශයෙන් පහත වැටුණි. කෙසේ වුවත් කොළඹ තේ වෙන්දේසි මිල ගණන් අනෙකුත් බොහෝ වෙන්දේසි මධ්‍යස්ථානවල මිලට වඩා ඉහළ පැවතිණි. රබර් අපනයන පරිමාව සියයට 10.0 කින් ඉහළ ගිය ද, රබර් මිල සියයට 16.1 කින් පහත වැටීම හේතුවෙන් පෙර වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය සමග සසඳන විට 2008 නොවැම්බර් මාසයේ රබර් අපනයන ආදායම සියයට 7.7 කින් පහත වැටුණි. මෑත කාලීනව අපනයන ආදායමට සැලකිය යුතු දායකත්වයක් ලබා දුන් සුළු කෘෂිකාර්මික භෝග අපනයන, මෙතෙක් පැවති වර්ධන ප්‍රවණතාවට වෙනස්ව යමින් පෙර වර්ෂයේ අනුරූප කාල පරිච්ඡේදය සමග සසඳන විට 2008 නොවැම්බර් මාසයේ දී සියයට 22.7 කින් පහත වැටුණි. 2008 නොවැම්බර් මාසය දක්වා සමුච්චිත ඉපැයීම්වල වටිනාකම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 7.456 ත් වූ අතර, එය පෙර වර්ෂයට අනුරූපව සියයට 9.7 ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. රජය විසින් ප්‍රකාශයට පත්කර ඇති සහන යෝජනාවලින් ක්‍රියාත්මක වීමත් සමග පවතින ගෝලීය ආර්ථික අවපාතය හමුවේ අපනයන ක්ෂේත්‍රයට යම්කිසි සහනයක් ලැබේ යැයි අපේක්ෂා කෙරේ.

පසුගිය මාස කිහිපයක් තුළ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළ ආනයන, 2008 නොවැම්බර් මාසයේ දී එ.ජ.ඩොලර් 977.7 ක අගයක් පෙන්නුම් කළ අතර, එය පෙර වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය සමග සසඳන විට එය සියයට 3.1 ක පහත වැටීමකි. ඇඟළුම්, ඛනිජ තෙල් නිෂ්පාදන සහ පොහොර ආදිය ඇතුලත් අන්තර් භාණ්ඩ මේ සඳහා දායකත්වයක් ලබා දී ඇත. ඛනිජ තෙල් අංශයේ පවතින උපනතීන් පෙන්නුම් කරමින්, පෙර වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සසඳන විට ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා වන වියදම නොවැම්බර් මාසයේදී පොහොර ආනයන වියදම එ.ජ. ඩොලර් දශ ලක්ෂ 72 ක අගයක් දක්වා සැළකිය යුතු අගයක් වර්ධනය විය. 2007 නොවැම්බර් මාසයේදී තිරිඟු ආනයනය නොකල අතර, 2008 නොවැම්බර් මාසයේදී පාරිභොගික භාණ්ඩ වර්ධනය සඳහා

**විදේශ වෙළෙඳමෙහි ක්‍රියාකාරීත්වය - 2008 නොවැම්බර් සහ 2008 ජනවාරි - නොවැම්බර්**

| | 2007 නොවැම්බර් එ.ජ.ඩො. දශ ලක්ෂ | 2008 නොවැම්බර් එ.ජ.ඩො. දශ ලක්ෂ | නොවැම්බර් වර්ධනය % | 2007 ජනවාරි-නොවැම්බර් එ.ජ.ඩො. දශ ලක්ෂ | 2008 ජනවාරි-නොවැම්බර් එ.ජ.ඩො. දශ ලක්ෂ | ජනවාරි සිට නොවැම්බර් වර්ධනය % |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | **577.90** | **645.09** | **11.63** | **6,798.44** | **7,456.03** | **9.67** |
| මෙයින් කෘෂිකාර්මික | 137.07 | 125.98 | -8.09 | 1,359.22 | 1,734.03 | 27.58 |
| මෙයින් තේ | 97.67 | 87.14 | -10.77 | 920.31 | 1,190.25 | 29.33 |
| කාර්මික | 431.76 | 512.0 | 18.69 | 5,283.33 | 5,603.31 | 6.06 |
| මෙයින් රෙදිපිළි හා ඇඟළුම් | 234.20 | 287.06 | 22.57 | 2,941.09 | 3,095.35 | 5.25 |
| ඛනිජ ද්‍රව්‍ය | 9.07 | 6.66 | -26.61 | 118.92 | 118.68 | -0.20 |
| **ආනයන** | **1,009.23** | **977.65** | **-3.13** | **10,136.34** | **12,959.59** | **27.85** |
| මෙයින් පාරිභෝගික භාණ්ඩ | 165.51 | 175.58 | 6.09 | 1,792.58 | 2,357.10 | 31.49 |
| අන්තර් භාණ්ඩ | 558.58 | 591.70 | 5.93 | 5,844.12 | 7,794.30 | 33.37 |
| මෙයින් ඛනිජ තෙල් | 213.76 | 150.46 | -29.61 | 2,185.13 | 3,173.28 | 45.22 |
| ආයෝජන භාණ්ඩ | 279.45 | 199.80 | 28.50 | 2,413.69 | 2,685.22 | 11.25 |
| **වෙළෙඳ ශේෂය** | **-431.33** | **-332.56** | **22.90** | **-3,337.90** | **-5,503.56** | **64.88** |

තිරිඟු ආනයනය ප්‍රධාන වශයෙන් දායක විය. 2008 නොවැම්බර් මාසයේ දී ආයෝජන භාණ්ඩ පෙර වර්ෂයේ අනුරූප කාල පරිච්ඡේදය හා සසඳන විට 28.5 කින් පහත වැටීමට, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනයන්ගේ ඇති වූ පහත වැටීම විශාල වශයෙන් හේතු විය. 2008 පළමු මාස එකොළහ තුළ ආනයනවල වටිනාකම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 12,960 ක වූ අතර, එය 2007 වර්ෂයේ අනුරූප කාල පරිච්ඡේදය සමග සසඳන විට සියයට 27.9 ක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

මෙහි ප්‍රතිඵලයක් ලෙස 2008 වර්ෂයේ ප්‍රථම වතාවට, නොවැම්බර් මාසය තුළ දී වෙළෙඳ හිඟය එ.ජ.ඩොලර් 332.6 ක් දක්වා සියයට 22.9 කින් පහත වැටුණි. 2007 පළමු මාස එකොළහ තුළ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 3.338 ක් වූ වෙළෙඳ හිඟය 2008 වසරේ අනුරූප කාලයේදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 5.504 දක්වා පුළුල් විය. පසුගිය මාස දෙක තුළ පහළ මට්ටමක පැවති ආනයන වර්ධනය, 2009 වර්ෂයේ වැඩි කාල සීමාවක් තුළ දී ද, එසේ පවතිනු ඇතැයි බලාපොරොත්තු වේ. 2008 ජනවාරි - නොවැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,682 ක් දක්වා ඉහළ ගිය පෞද්ගලික ප්‍රේෂණ ජංගම ගිණුමේ හිඟය අඩු කිරීම සඳහා උපකාරී විය. ඒ අනුව, ආසියානු නිෂ්කාෂණ සංගමයේ (ACU ) අරමුදල් සහිතව සහ රහිතව, දළ නිල සංචිත 2008 නොවැම්බර් මස අවසන් වන විට පිළිවෙලින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,608 හා 2,030 බැගින් වාර්තා කළ අතර, එය පිළිවෙළින් මාස 2.2 ක සහ 1.7 ක පමණ ආනයන මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් වේ. මෙම කාලපරිච්ඡේදය සඳහා විදේශ වෙළෙඳාමෙහි ක්‍රියාකාරීත්වය පහත සඳහන් සංඛ්‍යා සටහනින් දක්වා ඇත.

## 3. භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළ විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන් සහ විදේශ ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා විවෘත කිරීම

*රුපියල් වටිනාකමින් නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළ 2009 ජනවාරි මස 06 වන දින සිට බලපැවැත්වෙන පරිදි විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන්ට සහ විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා විවෘත කිරීමට රජය තීරණය කර ඇත. 2009 වසර සහ ඉදිරි කාලයට අදාළ මූල්‍ය සහ මුදල් අංශයේ ප්‍රතිපත්ති හඳුන්වාදීමේ ශ්‍රී ලංකා මහ බැංකුවේ "ප්‍රතිපත්ති පෙර දැක්ම" මගින් මෙම නව ආයෝජන ප්‍රවේශය ප්‍රකාශයට පත්කර ඇත. මෙම යෝජනා ක්‍රමයෙන් මූලිකව අරමුණු කරනුයේ රජයේ සුරැකුම්පත්වල ආයෝජන පදනම පුළුල් කිරීම, රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ විවිධාංගීකරණය කිරීම, විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන් හට පහසුවෙන් රජයේ සුරැකුම්පත් ලබාදීම සහ වඩාත් ස්ථාවර සුරැකුම්පත් වෙළෙඳපොලක් නිර්මාණය කිරීමත්ය. ඊට අමතරව මෙම ආයෝජන ක්‍රමය මගින් විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන්ට වඩාත් සුරක්ෂිත හා ඉහළ ද්‍රවශීලතාවයකින් යුත් ආයෝජන අවස්ථාවක් ලබාදෙන අතර ඔවුන්ගේ ආයෝජනයන්ට ආකර්ශනීය ඵලදායිතාවක්ද හිමිකර දෙනු ඇත.*

ලෝකයේ සියලුම රටවල් පාහේ ආවරණය කිරීමට බලාපොරොත්තුවන මෙම වැඩ පිළිවෙලට පහසුකම් සැලසීම පිණිස ඒකාබද්ධ ප්‍රධාන කළමනාකරුවන් සය දෙනෙකු පත් කර තිබේ. එනම් ලංකා බැංකුව, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී., ජාතික ඉතිරි කිරීමේ බැංකුව, මහජන බැංකුව, සම්පත් බැංකුව සහ සීමාසහිත නැට්වෙල්ත් සෙකියුරිටීස් එසේ පත් කළ ඒකාබද්ධ ප්‍රධාන කළමනාකරුවන් වේ. මෙම වැඩ සටහන 2009 ජනවාරි මස සිට තෝරාගත් කලාප කීපයකට හඳුන්වා දෙනු ඇත. මෙම කලාපවලට අයත් වන්නේ මැද පෙරදිග (ඩුබායි, අබුඩාබි, කුවේට්, ජෝර්දාන්, ලෙබනනය, කටාර්, බහරේන්, සවුදි අරාබිය හා ඕමානය) යුරෝපය (ඉතාලිය, ප්‍රංශය, ස්විට්සර්ලන්තය, ජර්මනිය, නෙදර්ලන්තය සහ එක්සත් රාජධානිය), උතුරු ඇමරිකාව (ඇ.එ.ජ. සහ කැනඩාව) සහ ආසියාව (දකුණු කොරියාව, මැලේසියාව, සිංගප්පූරුව, ජපානය, ඉන්දියාව සහ බංග්ලාදේශය) යන කලාපයන්ය. මීට අමතරව මෙම ආයෝජන වැඩ සටහන මගින් නවසීලන්තය සහ ඕස්ට්‍රේලියාව ද ආවරණය කරනු ලැබේ. මෙම ක්‍රමය යටතේ භාණ්ඩාගාර බිල්පත්වල හෝ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කිරීම සඳහා භාණ්ඩාගාර බිල්පත්/භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජන කිරීමේ බාහිර රුපියල් ගිණුමක් (TIERA-D) ආරම්භ කිරීම මගින් ඕනෑම පත්කළ ඒකාබද්ධ ප්‍රධාන කළමනාකරුවෙකු හරහා සිදුකළ හැකි අතර, (TIERA-D)

ගිණුම තුළට හා ඉන් පිටතට කරනු ලබන ප්‍රේෂණ විනිමය පාලන නීති වලින් නිදහස් වේ.

මෙම යෝජනා ක්‍රමය යටතේ ආයෝජන අවස්ථාව හිමිවන විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන් වශයෙන් සළකනු ලබන (අ) විදේශ රටවල ස්ථිර පදිංචි /පදිංචිය ලබා සිටින ශ්‍රී ලාංකිකයන් (නිර්නේවාසිකයන්) (ආ) විදෙස් රටවල රැකියාවල නියුතු හෝ ව්‍යාපාරික කටයුතුවල නිරත ශ්‍රී ලාංකික පුරවැසියන් (ඇ) ද්විත්ව පුරවැසිභාවය ලබා සිටින ශ්‍රී ලාංකික වෘත්තිකයින් (ඈ) ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටවල ජීවත්වන විදේශීය මුදලින් ආදායම් උපයන ශ්‍රී ලාංකික වෘත්තිකයන් සහ (ඉ) විශ්වසනීයත්වය පදනම් කරගෙන ඉහත පුද්ගලයන් වෙනුවෙන් කටයුතු කරන බැංකුවලට මින් ඉදිරියට රුපියල් වටිනාකමින් නිකුත් කරන භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කිරීමේ අනුමැතිය හිමිවේ. තවද, ආයෝජනයට අදාල පොලී, ප්‍රාග්ධන ලාභ සහ කල්පිරීමේදී ලැබෙන ආදායම් ශ්‍රී ලංකාවේ හෝ එතෙර ඕනෑම බැංකු ගිණුමකට බැර කළ හැකිය.

මෙම ආයෝජන අවස්ථාව පිළිබඳ තවදුරටත් තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් (www.cbsl.gov.lk) සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් ද ලබාගත හැකිය.

දුරකථන - 94 11 2477777/274/316/076/291
ෆැක්ස් - 94 11 2477718/719/759
ඊමේල් - debt@cbsl.lk,siriwardena@cbsl.lk

## 4. මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය - 2009 ජනවාරි

*මහ බැංකුව සමග සිදු කරනු ලබන ප්‍රතිවිකුණුම් ගනුදෙනු මත පනවා තිබූ දඬ පොලී අනුපාතිකය වහාම බල පැවැත්වෙන පරිදි සියයට 17 දක්වා පදනම් අංක 200 කින් පහත දැමීමට මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. දඬ පොලී අනුපාතිකය වර්තමානයේදී එක් දින පොලී අනුපාතික සඳහා ඉහළ සීමාවක් ලෙස ද, සෙසු වෙළෙඳපොළ පොලී අනුපාතික සඳහා පදනම් නිර්ණායකයක් ලෙස ද සලකනු ලබයි. උද්ධමනය හා උද්ධමන අපේක්ෂා අඩුවීම මෙන්ම රාජ්‍ය සුරකුම්පත් ඵලදා අගයන් ඇතුලු වෙළෙඳපොළ පොලී අනුපාතික ක්‍රමයෙන් පහත බැසීම හේතුකොටගෙන මහ බැංකුව මෙලෙස සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කිරීමට තීරණය කර ඇත. පසුගිය හය මාසය තුළ උද්ධමනයෙහි සැළකිය යුතු පහත බැසීමත්, 2009 වසර තුළ උද්ධමනය අඩුවීම පිළිබඳ අපේක්ෂාවන් පැවතීමත් වෙළෙඳපොළ පොලී අනුපාතික අඩු කිරීමට දායක විය. කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (පදනම් වර්ෂය - 2002) ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන උද්ධමනය 2008 අග වනවිට සියයට 14.4 දක්වා අඩු වූ අතර, මෙය 2009 මැද වන විට තනි අගයක් දක්වා තවදුරටත් පහත බසිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මහ බැංකුව විසින් මුදල් ස්ථායිතාව උදෙසා පවත්වාගෙන යනු ලබන ප්‍රතිපත්තීන්ගේ ප්‍රතිඵලයක් ලෙස උද්ධමනය ඉන් පසුවද පහත අගයක පවතිනු ඇතැයි ද අපේක්ෂිතය. අපේක්ෂිත අන්දමට මිල ඉහළ යාමේ ප්‍රවණතාව අඛණ්ඩව පහත බසින්නේ නම් මූල්‍ය අතරමැදියන්ට තම ණය පොලී අනුපාතික තවදුරටත් අඩු කිරීමට හැකිවන ලෙස තම මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කිරීමට මහ බැංකුව සූදානම්ව සිටී.*

ප්‍රතිවිකුණුම් ගනුදෙනු මත පනවා තිබූ දඬ පොලී අනුපාතිකය අඩු කිරීම හේතුවෙන් වෙළෙඳපොළ පොලී අනුපාතික අඩුවීම නිසා ලෝක ආර්ථිකයේ අඛණ්ඩ පසුබෑම හා ඒ හේතුවෙන් අඩු වූ විදේශීය ඉල්ලුම හමුවේ ආර්ථික ක්‍රියාකාරකම් දිරිමත් කිරීමටත් ආර්ථික වර්ධනය අඩු නොවී පවත්වාගෙන යෑමටත් හැකිවනු ඇත. ඒ අනුව බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන තම පොලී අනුපාතික අඩු කරනු ඇතැයි ද, එහි ප්‍රතිලාභ තම ගනුදෙනුකරුවන් හට ලබාදෙනු ඇතැයි ද මහ බැංකුව අපේක්ෂා කරයි. ගනුදෙනු පිරිවැය අඩු කිරීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව වෙළෙඳපොළ ණය අනුපාතිකයන්හි වෙනස්වීම අඛණ්ඩව නිරීක්ෂණය කරනු ලබයි. මෙය සැළකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2009 වර්ෂයේ ජනවාරි මස සිට එක් එක් බැංකු මගින් ප්‍රකාශිත ප්‍රමුඛ ණය පොලී අනුපාතික ප්‍රකාශයට පත් කිරීමට විධිවිධාන සලස්වනු ලැබ ඇත.

2008 වර්ෂයේ නොවැම්බර් මස අවසානය වන විට පුළුල් මුදල් සැපයුමේ වර්ධනය හා පෞද්ගලික අංශය වෙත දෙන ලද ණයෙහි වර්ධනය පිළිවෙලින් සියයට 7.3 ක හා සියයට 9.2 ක තනි අගයක් දක්වා අඩු වී ඇත. මුදල් සමස්තයන්හි මෙම අඩුවීම සහ සැපයුම් අංශයේ හිතකර වර්ධනයන් මිල සහ උද්ධමන අපේක්ෂා වෙත යහපත් බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, ඒ අනුව 2009 වර්ෂය තුළදී මහ බැංකුවට තම මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය යම්තාක් දුරකට ලිහිල් කිරීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙකී වර්ධනයන් 2009 වර්ෂය සඳහා වන මුදල් වැඩසටහන සකස් කිරීමේ දී සැලකිල්ලට ගනු ලැබූ අතර, එය "2009 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති පෙර දැක්ම", තුළින් ප්‍රකාශයට පත් කරන ලදී.

මෙම පුවත්පත් නිවේදනය ප්‍රකාශයට පත් කිරීමට නියමිත වූ 2009 ජනවාරි 15 වැනි දිනට කලින් නිකුත් කර ඇත. මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති විවරණය 2009 පෙබරවාරි 11 වැනි දින නිකුත් කරනු ඇත.

## 5. සුනාමියෙන් හානියට පත් සංචාරක අංශයේ ව්‍යාපෘති සඳහා සහන සැලසීම

*ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද සුසහන හා කුඩා ව්‍යාපාර නංවාලීමේ ණය යෝජනා ක්‍රම දෙක යටතේ ණය පහසුකම් ලබා දී ඇති සුනාමියෙන් හානියට පත් සංචාරක අංශයේ ව්‍යාපාර සඳහා ලබාගත් මුදල්වල ආපසු ගෙවීමේ කාලය වසර දෙකකින් ද සහන කාලය තවත් වසරකින්ද දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කර ඇත.*

2004.12.26 දින ඇති වූ සුනාමි ව්‍යසනයෙන් හානියට පත් සුළු, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර යළි ගොඩනංවා ගැනීමට උපකාර කිරීමේ අරමුණින් යුතුව සහභාගීත්ව මූල්‍ය ආයතන 32 ක් හරහා සුසහන සහ කුඩා ව්‍යාපාර නංවාලීමේ වැඩ සටහන නමින් විශේෂ ණය යෝජනා ක්‍රම දෙකක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාවට නංවන ලදී. 2005 - 2007 කාලය තුළදී ක්‍රියාවට නංවන ලද මෙම ණය යෝජනා ක්‍රම දෙක යටතේ, සුනාමි ව්‍යසනය බලපෑ ප්‍රදේශවල විනාශයට පත්ව තිබූ සුළු, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර 10,532 ක් සඳහා රුපියල මිලියන 5,764 ක ණය මුදල් ප්‍රදානය කර තිබේ. ඒ අතර, හානියට පත්ව තිබූ සංචාරක හෝටල්, තානායම්, භෝජන ශාලා මැණික් හා ස්වර්ණාභරණ ව්‍යාපාර, බතික් හා නිමි ඇඳුම් ආදී සංචාරක ව්‍යාපාරය හා සම්බන්ධිත සුළු, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර 400 කට පමණ මෙම ණය යෝජනා ක්‍රම දෙක යටතේ රුපියල් මිලියන 1,077 ක ණය ප්‍රදානය කර තිබුණි.

සංචාරක අමාත්‍යාංශය විසින් ඇස්තමේන්තු කරන ලද පරිදි සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ ආයතන 586 ක් සුනාමි ව්‍යසනයෙන් සෘජු ලෙසම හානියට පත්ව තිබූ අතර, ඒවායින් ආයතන 65 ක් මධ්‍යම හා මහා පරිමාණ සංචාරක හෝටල් හෝ තානායම් ගණයට අයත් විය. එවැනි ව්‍යාපාර සඳහා එක් ව්‍යාපාරයකට රුපියල් මිලියන 60 ක් දක්වා ණය පහසුකම් සැපයීමට විධිවිධාන යොදන ලදී. තවද, එම ව්‍යාපාර සඳහා ලබාගත් ණය ආපසු තේරීමේදී අවුරුදු 2 ක සහන කාලයක් ද සහිතව අවුරුදු 8 ක සම්පූර්ණ ආපසු ගෙවීමේ කාලයක් ලබා දෙන ලදී.

පසුගිය මාස කිහිපය තුළදී සංචාරක පැමිණීම අඩු වූ බැවින් ස්වකීය ආදායම් තත්ත්වය පහත වැටී ඇති බව සංචාරක කර්මාන්තය ආශ්‍රිතව ව්‍යාපාර සඳහා ණය ලබාගෙන තිබූ ආයතන රාශියක්ම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්තා කල අතර දුෂ්කරතාවයකින් තොරව ණය ආපසු ගෙවීම පහසුකර ගැනීම සඳහා තමන්ට දැනට ලබා දී ඇති සහන කාලය හා ණය ආපසු ගෙවීමේ කාලය ද දීර්ඝ කිරීම පිළිබඳව සලකා බලන ලෙස ඔවුන් මහ බැංකුවෙන් ඉල්ලා සිටින ලදී.

ඒ අනුව, ජාතික ආර්ථිකයට සංචාරක කර්මාන්තයේ ඇති බලපෑම හා සංචාරක කර්මාන්තයෙහි නියැලෙන සුනාමියෙන් හානියට පත්ව තිබූ ඇතැම් ව්‍යාපාරයන්හි ආදායම් තත්ත්වයන්හි උද්ගතව ඇති ගැටලු ද සැලකිල්ලට ගනිමින්, සුසහන හා කුඩා ව්‍යාපාර නංවාලීමේ ණය ක්‍රම දෙක යටතේ ණය ලබාගත් සංචාරක කර්මාන්තය හා ආශ්‍රිත ව්‍යාපාර සඳහා පහත සඳහන් සහනයන් ප්‍රදානය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කර ඇත.

(අ) සුනාමියෙන් හානියට පත්ව සංචාරක කර්මාන්තය ආශ්‍රිත ව්‍යාපාර යළි ගොඩනගා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද සුසහන හා කුඩා ව්‍යාපාර නංවාලීමේ ණය ක්‍රම දෙක යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතනවලින් ණය ආපසු ගෙවීමේදී සම්පූර්ණ සහන කාලය වර්ෂ 3 ක් වනසේ සහන කාලය තවත් වසරකින් දීර්ඝ කිරීම.

(ආ) සුසහන හා කුඩා ව්‍යාපාර නංවාලීමේ ණය යෝජන ක්‍රම දෙක යටතේ එලෙස ලබාගත් ණය උපලේඛණගත කිරීමේදී අවුරුදු 3 ක සහන කාලයද ඇතුලත්ව ණය ආපසු ගෙවීමේ උපරිම කාලය වර්ෂ 8 සිට 10 දක්වා ඉහළ නැංවීම.

ඉහත සඳහන් සහනය ලබාදීමට සුදුසු යැයි තීරණය කරන එක් එක් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රවාහන දුෂ්කරතා අධ්‍යයනය කිරීමෙන් පසු එවැනි ණය මුදල් උප ලේඛණගත කිරීම සඳහා පියවර ගන්නා ලෙසත්, දීර්ඝ කරන ලද සහන කාලය තුලදී වාර්ෂිකව සියයට 6 ක පොලී මුදල් පමණක් අයකරන ලෙසත් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත දැනටමත් උපදෙස් දී ඇත.

## 6. රුපියල අවප්‍රමාණය විම හෝ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් අරමුදල් ලබාගැනීම (Currency devaluation or IMF bailout) යටතේ 2009 ජනවාරි මස 18 වන දින මාධ්‍යවල පළවූ ලිපි පිළිබඳව කරනු ලබන පැහැදිලි කිරීම

*මෑතකදී මාධ්‍යයන්හි රුපියල අවප්‍රමාණය වීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් අරමුදල් ලබාගැනීම සම්බන්ධයෙන් පළවූ වාර්තාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අවධානය යොමු කරනු ලැබේ.*

එම වාර්තාවන්ට අනුව, ශ්‍රී ලංකාවේ විදේශ සංචිත මට්ටම, 1976 වසරේ පාලිත ආර්ථික යුගයේ පැවැති විදේශ සංචිත මට්ටමට සමාන වේ යැයි සමහර ආර්ථික විද්‍යාඥයින් පවසන බව පැවසේ. වර්තමාන දළ නිල සංචිත මට්ටම, 1977 කාලයට පෙර පැවැති අගයට වැඩිවනවා පමණක් නොව 2004 අවසානය වනවිට තිබූ විදේශ සංචිත මට්ටමටත් වඩා ඉහළ මට්ටමක පවතින බැවින් කුමන තත්ත්වයක් යටතේ වුවද මෙම ප්‍රකාශයේ කිසිදු සත්‍යතාවයක් නොමැත. ආසියානු නිෂ්කාශන සංගමයේ ලැබීම් ඇතුළත් දළ නිල සංචිත ප්‍රමාණය, 2008 වසර අවසානයේදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,560.5 ක් වූ අතර, 2004 අවසානයේදී එය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,195.8 ක් විය. එමෙන්ම, 2008 වසරේ දී නිවේදනය කරන ලද නවතම 39 වන ජපාන යෙන් ණය පැකේජය යටතේ, විවිධ යටිතල පහසුකම් ව්‍යාපෘති සහ වැඩ සටහන් සඳහා ජපාන රජය විසින් ජපාන යෙන් දශ ලක්ෂ 35,000 (එ.ජ.ඩොලර් දශ ලක්ෂ 388) ක් ශ්‍රී ලංකා රජයට ලබාදීමට එකඟ වන ලදී. ඒ අනුව, ජපාන රජය විසින් ශ්‍රී ලංකාවට ලබාදීමට එකඟ වූ ණය මුදල් අඩු කරනු ඇතැයි හෝ කපා හරිනු ඇතැයි සිතීමට කිසිදු සාක්ෂියක් නොමැත.

මේ අතර, ජාත්‍යන්තර මූල්‍ය අර්බුදය හමුවේ, භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරයන්හි ආයෝජනය කර තිබූ විදේශීය ආයෝජන, ආයෝජකයින් විසින් නැවත සිය රට කරා ගෙනයාම සහ ඛනිජ තෙල් ආනයනය සඳහා ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලදී කරන ලද විශාල ගෙවීම් හේතුවෙන් දළ නිල සංචිත අඩුවීමක් සිදු වී ඇති බව පිලි ගැනේ. එසේ නමුදු, 2009 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති පෙර දැක්මෙහි සඳහන් කළ පරිදි සංචිත නැවත වර්ධනය කිරීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රමවේදයන් කිහිපයක් අනුගමනය කර ඇත. ඒ අනුව මින් සමහරක් වනුයේ:

1. මුදල් හුවමාරු (Currency Swap) එකඟතා මගින් දළ නිල සංචිත වැඩිකර ගැනීම සඳහා දැනටමත් ඇතැම් මහ බැංකු කිහිපයක් සමඟ පියවර අරගෙන ඇත. ඇතැම් මහ බැංකු මේ සඳහා දැනටමත් ධනාත්මක ප්‍රතිචාර දක්වා ඇති අතර මෙයින් මහ බැංකු 2 ක් සමග සාකච්ඡා දැනට අවසන් මට්ටමක පවතී.

2. විදේශයන්හි සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයින් අතර ආයෝජන ප්‍රභවයක් ලෙස භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර ආයෝජන ජනප්‍රිය කරවීම. ශ්‍රී ලංකා මහ බැංකුව අනුමත කල ප්‍රධාන කළමනාකරුවන් 6 දෙනෙකු, ලොව පුරා මෙම ආයෝජන දිරිමත් කරවීම සඳහා දැනටමත් පියවර කිහිපයක් ගෙන ඇත.

3. අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් (NRFC) සහ නේවාසික විදේශ ව්‍යවහාර මුදල් (RFC) ගිණුම්වලට මුදල් තැන්පත් කිරීම වර්ධනය කිරීමේ විශේෂ දිරි ගැන්වීමක් ලෙස, 2009 පෙබරවාරි 1 වැනිදා සිට අනේවාසික හා නේවාසික විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු මත සියයට 20 ක ප්‍රසාද පොලියක් ගෙවීම.

4. නව විදේශීය මුදල් ගලා ඒම් සාමාන්‍ය ආදායම් බදුවලට යටත් වේ නම් එවැනි මුදල් ගලාඒම සඳහා එක් වතාවකදී පමණක් ගෙවන සහනදායී අනුපාතයක් යටතේ ආදායම් බදු ගෙවීමට, ඇති හැකියාව පිරි නැමීමට සළකා බලමින් සිටී. මෙම දිරි ගැන්වීමත් සමඟ ඉතා විශාල විදේශ ආයෝජන ප්‍රමාණයක් ලබාගත හැකි වේ යැයි අපේක්ෂා කෙරේ.

ඉහත සඳහන් ක්‍රියා මාර්ග තුළින් සැළකිය යුතු ප්‍රමාණයකින් නිල සංචිත ප්‍රමාණය වැඩි කර ගැනීමට හැකිවනු ඇතැයි ශ්‍රී ලංකා මහ බැංකුව විශ්වාස කරන අතර සමහර ආර්ථික විද්‍යාඥයින් විසින් ශ්‍රී ලංකා රුපියල අව ප්‍රමාණය කිරීම හෝ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහායන් ලබා ගැනීම සිදුවනු ඇතැයි පැවසීම වැරදි ප්‍රකාශයක් වන අතරම එය නොමග යැවීමක් ද වේ.

## 7. 2008 වසරේ නොවැම්බර් මස අවසානයේ දී පැවති විදේශ සංචිත තත්ත්වය පිළිබඳ පැහැදිලි කිරීම

රටේ විදේශ සංචිත පිළිබඳව සාවද්‍ය තොරතුරු දක්වමින් මහජනතාව සහ ව්‍යාපාරික ප්‍රජාව නොමග යවන අයුරින් පළවූ මෑතකාලීන මාධ්‍ය වාර්තා පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ අවධානය යොමු වී ඇත. එමනිසා, විදේශ සංචිත තත්ත්වය පිළිබඳව පැහැදිලි කිරීම සඳහා මෙම ප්‍රකාශය නිකුත් කෙරේ.

2008 වසරේ නොවැම්බර් මස අවසානයේ දී මුළු සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 3,914 ක් වූ අතර, එය ආනයනික මාස 3.3 ක් සඳහා ප්‍රමාණවත් විය. මුළු විදේශීය සංචිත සඳහා මහ බැංකුව සහ රජය විසින් පවත්වා ගෙන යනු ලබන දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,608 ක් වූ අතර, එය ආනයනික මාස 2.2 ක් සඳහා ප්‍රමාණවත් විය.

රටේ මුළු සංචිත සහ දළ නිල සංචිත අතර පවත්නා පැහැදිලි වෙනස නොසලකා 2007 වසර අවසානය තෙක් පැවති මුළු සංචිත ප්‍රමාණය, 2008 වසරේ නොවැම්බර් අවසානයේ පැවති දළ නිල සංචිත සමග සංසන්දනය කරමින් ඇතැම් ආර්ථික විශ්ලේෂකයින් විසින් විදේශ සංචිත පිළිබඳ නොමග යවන සුළු අදහස් සති අග පුවත්පත්වලට දක්වා ඇත.

## 8. නේවාසික සහ අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු සඳහා පොලිය මත රුපියල්වලින් ප්‍රසාද දීමනාවක් ගෙවීම.

*"2009 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශ ප්‍රතිපත්ති පෙර දැක්ම" යන මැයින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පළ කළ ප්‍රකාශනයේ ද සඳහන් පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රේෂණ ලැබීම් ප්‍රවර්ධනය කිරීමට සහ විදේශ විනිමය සංචිත ඉහළ නැංවීමට විවිධ පියවර අනුගමනය කර ඇත. ඒ අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකු, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව විසින් 2009 වසරේ පෙබරවාරි මස පළමුවන දින සිට නේවාසික සහ අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සඳහා ගෙවන පොලිය මත ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රසාද පොලී දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා රජය පියවර ගෙන ඇත. මෙම පියවර මගින් බැංකු පද්ධතිය හරහා ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ ප්‍රේෂණ ඉහළ නැංවීම මෙන්ම ඉහත සඳහන් බැංකුවල තම විදේශ මුදල් තැන්පත් කිරීම සඳහා මහජනයා දිරිගැන්වීම පෙළඹවීමට ද අපේක්ෂා කෙරේ. බැංකු පද්ධතිය තුළට ගලා එන විදේශ විනිමය ප්‍රයෝජනයට ගනිමින් ණය නිකුත් කිරීමට ඉහත සඳහන් බැංකුවලට හැකි වන අතර, ඒ තුළින් ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා එම සම්පත් සඵලදායී ලෙස ප්‍රයෝජනයට ගතහැකි වේ.*

විදේශ මුදල් තැන්පතු සඳහා ගෙවන පොලී මුදලින් සියයට 20 ක් වන මෙම ප්‍රසාද දීමනාව 2009 වසරේ පෙබරවාරි මස පළමුවන දින සිට ගෙවනු ලැබේ. මෙම ප්‍රසාද දීමනාව තැන්පත්කරුගේ නමින් අරඹන රුපියල් ගිණුමකට හෝ තැන්පත්කරු විසින් නම් කරනු ලබන ඕනෑම ගිණුමකට බැර කළ හැක. නේවාසික සහ අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට මෙම ප්‍රසාද දීමනාව බැර නොකෙරේ. ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ පළ කෙරෙන පසුගිය මාසයේ මාසික සාමාන්‍ය විනිමය අනුපාතිකය පදනම් කරගෙන මෙම දීමනාව ගණනය කරන අතර, විදේශ මුදල් තැන්පතු සඳහා පොලිය බැර කරන දිනයේදීම මෙම දීමනාව ද බැර කරනු ඇත. මෙම පොලී දීමනාව ආදායම් බදුවලින් නිදහස් වේ. නේවාසික සහ අනේවාසික විදේශ ව්‍යාවහාර මුදල් ගිණුම් මත ගෙවනු ලබන පොලී මුදල් දැනටමත් ආදායම් බදුවලින් නිදහස් කර ඇත.

## 9. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකා ඛනිජ තෙල් සංස්ථාව හා වාණිජ බැංකු කීපයක් සමග ඇතිකර ගන්නා ලද ඉදිරි සුරැකුම් ගිවිසුම් පිළිබඳව නිකුත් කරනු ලැබූ විධානයන්

*ලංකා ඛනිජ තෙල් සංස්ථාව විසින් වාණිජ බැංකු කීපයක් සමග ඇති කරගන ලැබූ ඉදිරි සුරැකුම් ගිවිසුම් (hedging transactions) පිළිබඳව පුවත්පත්වල පළ වූ වාර්තාවන්ට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය නීති පනතේ 29(1) වගන්තිය ප්‍රකාරව 2008 නොවැම්බර් මස 13 වැනි දින පරීක්ෂණ ආරම්භ කරන ලදී. තවද, 2008 නොවැම්බර් මස 28 වැනි දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අතුරු නියෝගයක් නිකුත් කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට අදාළ ගිවිසුම් පිළිබඳව පරීක්ෂා කර බලා අදාළ නීතිවලට අනුව නිසි ක්‍රියා මාර්ග ගන්නා ලෙසට නියෝග කරන ලදී.*

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරන ලද පරීක්ෂණයන්ගෙන් හෙළිදරව් වූ පරිදි අදාළ බැංකු විසින් ඉහත සඳහන් කරන ලද සුරැකුම් ගිවිසුම්වලට එළැඹීමේදී පිළිපැදිය යුතු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබ ඇති විචක්ෂණශීලී නියමයන් මෙන්ම පොදුවේ පිළිගනු ලැබ ඇති යහ පිළිවෙත් ද විචක්ෂණශීලී පොදු පිළිගැනීම් ද අනුගමනය කොට නොමැති බව අනාවරණය විය. එකී හෙළිදරව්වීම්වලට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ඉහත සඳහන් කරන ලද ඉදිරි සුරැකුම් ගිවිසුම් නිසි ආකාරයෙන් එළැඹී නැති බවට තීරණය කරනු ලැබූ අතර, එකී ගිවිසුම් සම්බන්ධයෙන් ඉදිරි කටයුතුවලින් වැලකී සටින ලෙසත්, අදාළ බැංකුවලට 2008 දෙසැම්බර් මස 16 වැනි දින දැනුම් දෙන ලදී.

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2009 ජනවාරි මස 27 වැනි දින නිකුත් කරනු ලැබූ නියෝගයන් මඟින් ඉහත සඳහන් කරන ලද ඉදිරි සුරැකුම් ගිවිසුම්වලට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ වූ නඩු කටයුතු අවසන් කරනු ලැබූවද, එම ගිවිසුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාළ වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද විධිවිධානයන් ඉදිරියටත් ක්‍රියාත්මක වන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

## 10. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද) 2007, 2008 සහ 2009

(2002 = 100)

| මාසය | දර්ශකය | | | මාසික වෙනස්වීම % | | | ලක්ෂ්‍යමය වෙනස්වීම % | | | වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2007 | 2008 | 2009 | 2007 | 2008 | 2009 | 2007 | 2008 | 2009 | 2007 | 2008 | 2009 |
| ජනවාරි | 151.8 | 183.5 | 203.1 | 1.3 | 3.0 | -0.3 | 13.7 | 20.8 | 10.7 | 10.6 | 16.4 | 21.6 |
| පෙබරවාරි | 155.2 | 188.6 | | 2.2 | 2.8 | | 15.2 | 21.6 | | 11.1 | 17.0 | |
| මාර්තු | 155.0 | 191.9 | | -0.1 | 1.7 | | 15.1 | 23.8 | | 11.7 | 17.7 | |
| අප්‍රේල් | 156.3 | 195.4 | | 0.8 | 1.8 | | 14.3 | 25.0 | | 12.3 | 18.7 | |
| මැයි | 157.3 | 198.5 | | 0.6 | 1.6 | | 13.2 | 26.2 | | 12.6 | 19.8 | |
| ජූනි | 160.6 | 205.9 | | 2.1 | 3.7 | | 13.5 | 28.2 | | 12.8 | 21.0 | |
| ජූලි | 163.1 | 206.4 | | 1.6 | 0.2 | | 15.4 | 26.6 | | 13.3 | 21.9 | |
| අගෝස්තු | 165.2 | 206.3 | | 1.3 | 0.0 | | 16.5 | 24.9 | | 13.8 | 22.6 | |
| සැප්තැම්බර් | 166.7 | 207.2 | | 0.9 | 0.4 | | 16.1 | 24.3 | | 14.2 | 23.2 | |
| ඔක්තෝබර් | 171.8 | 206.6 | | 3.0 | -0.3 | | 18.2 | 20.2 | | 14.8 | 23.4 | |
| නොවැම්බර් | 176.4 | 205.2 | | 2.7 | -0.7 | | 19.3 | 16.3 | | 15.4 | 23.0 | |
| දෙසැම්බර් | 178.1 | 203.7 | | 1.0 | -0.7 | | 18.8 | 14.4 | | 15.8 | 22.6 | |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 3 වන කොටස
## මහජනයා වෙත කරනු ලබන නිවේදනයයි
## 2009 ජනවාරි

### 1. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය සහ අධීක්ෂණය කරනු ලබන මූල්‍ය ආයතන

පහත සඳහන් මූල්‍ය ආයතන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය හා අධීක්ෂණය කරනු ලබන බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

*1.* 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍ර ලබාදී ඇති වාණිජ බැංකු සහ විශේෂිත බැංකු.

2. 1988 අංක 30 දරන බැංකු පනත යටතේ ලියාපදිංචි කරන ලද මුදල් සමාගම්.

3. 2000අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි කරන ලද විශේෂිත කල්බදු මූල්‍යකරණ ආයතන

4. 1937 අංක 7 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත (සංශෝධිත) සහ 1923 අංක 8 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත (සශෝධිත) යටතේ මහ බැංකුව විසින් පත් කරනු ලැබ ඇති රජයේ සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික අලෙවිකරුවන්.

ඉහත සඳහන් මූල්‍ය ආයතන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අන්තර් ජාතිකව පිළිගත් ක්‍රමවේදයන්ට හා නියාමනයන්ට අනුව නියාමනය සහ අධීක්ෂණය සිදු කරයි. මෙයට අමතරව විශේෂයෙන්ම දේශීය ආර්ථික හා සමාජ වාතාවරණයන්ට ගැලපෙන පරිදි සකස් කරන ලද නියාමන අවශ්‍යතාවයන්ද නියම කරනු ලබයි.

මහ බැංකුව විසින් සිදුකරනු ලබන දුරස්ථ අධීක්ෂණ කටයුතු සහ එතැන් පරීක්ෂණ කටයුතු මගින් මෙම ආයතනවල ක්‍රියාකාරකම් සමීපස්ථ ලෙස හා නිරන්තරව සිදුකරගෙන යනු ලබන බව මහජනතාව වෙත මහ බැංකුව තවදුරටත් දන්වා සිටී. මූල්‍ය පද්ධතියේ මෑතකදී හටගත් සිදුවීම් පිළිබඳව මහ බැංකුව සිය නිරන්තර විශේෂ අවධානය යොමු කරන ලද අතර මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සඳහා නීතියෙන් පවරනු ලැබ ඇති වෙනත් ඕනෑම පියවරක් ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරනු ලබන බව ද මහ බැංකුව අවධාරණය කර සිටී.

බලපත්‍රලාභී බැංකු, ලියාපදිංචි මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සහ රජයේ සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික අලෙවිකරුවන්ගේ නාම ලේඛන මහ බැංකුව විසින් කලින් කලට ප්‍රසිද්ධ කරනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, බලපත්‍රලාභී බැංකු, ලියාපදිංචි මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සහ රජයේ සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික අලෙවිකරුවන්ට බලපෑ හැකි කිසියම් හෝ අහිතකර තත්ත්වයන් වළක්වාලීමට නිරන්තරයෙන්ම සුදුසු නියාමන කටයුතු කරගෙන යනු ලබන බව නැවත අවධාරණය කරන අතර බලපත්‍රලාභී බැංකු, ලියාපදිංචි මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සහ රජයේ සුරැකුම්පත් පිළිබඳ අලෙවිකරුවන් සමග පවත්වාගෙන යන ගනුදෙනු සම්බන්ධයෙන් අනිසි බියක් ඇතිකර ගැනීමට කිසිදු හේතුවක් නොමැති බව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනතාව වෙත මෙයින් දන්වා සිටී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණයට හා නියාමනයට ලක්වන මූල්‍ය ආයතන සම්බන්ධව ගනු ලබන තීරණ පිළිබඳව පුවත්පත් හා අනෙකුත් මාධ්‍ය මගින් විටින් විට මහජනයා දැනුවත් කිරීම සඳහා සුදුසු පියවර ගනු ලබන බව තවදුරටත් දන්වා සිටී.

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ | අධිකාරි |
| බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව දෙපාර්තමේන්තුව | බැංකු නොවන මූල්‍යමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව | රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව |

## 2. නීති විරෝධී පිරමිඩාකාර යෝජනා ක්‍රම පිළිබඳ පැහැදිලි කිරීමේ නිවේදනයයි (මහ බැංකුව විසින් 2008.12.18 දින අනුමත කරන ලදී)

*1988 අංක 30 දරන බැංකු පනතේ 83 ඇ වගන්තියේ දැක්වෙන "නීති විරෝධී යෝජනා ක්‍රම" හඳුනාගැනීම උදෙසා මහජනතාවට සහ නීතිය ක්‍රියාත්මක කරන නියෝජිත ආයතනයන්ට නිරවුල් අවබෝධයක් ලබාදීමේ අරමුණින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම පැහැදිලි කිරීමේ නිවේදනය නිකුත් කරනු ලැබේ.*

1. 1988අංක 30 දරන බැංකු පනතේ 83 ඇ වගන්තියේ දක්වා ඇති ආකාරයට "නීති විරෝධී යෝජනා ක්‍රමයක්" යනු සාමාජිකයින්ට මුදලින් හෝ මූල්‍යමය අගයකින් හෝ ගෙවීමක් කිරීමට නැතහොත් ආයකවීමට සිදු වන්නා වූත්, එමගින් සහභාගි වන්නන් උපයනු ලබන ප්‍රතිලාභ,

( i) යෝජනා ක්‍රමයේ සාමාජිකයින් සංඛ්‍යාව වැඩිවීම මත, හෝ

( ii) යෝජනා ක්‍රමයේ සාමාජිකයින් විසින් ගෙවනු ලබන මුදල් ප්‍රමාණයේ වැඩිවීම මත හෝ

බොහෝ දුරට තීරණය වන්නා වූත් ක්‍රමයකි.

ඒ අනුව, මෙම යෝජනා ක්‍රමවලට සම්බන්ධ වන නව සාමාජිකයින් එහි ප්‍රවර්ධකයාට මුලින් මුදලක් ගෙවිය යුතුය. ඉන්පසු එම නව සාමාජිකයින් විසින් අතිරේක සාමාජිකයින් බඳවා ගැනීමෙන් සහ එම අතිරේක සාමාජිකයින් විසින් අමතර සාමාජිකයින් බඳවා ගැනීමෙන් උපයාගත හැකි ප්‍රතිලාභ (මූල්‍ය හෝ වෙනත් වරප්‍රසාද) පිළිබඳව සාමාජිකයින්ට පොරොන්දු ලබාදේ. කෙසේ වෙතත් මෙවැනි යෝජනා ක්‍රම බොහෝ විට පෙනී සිටින්නේ භාණ්ඩ හා සේවා අලෙවි කරන යෝජනා ක්‍රම ලෙසටය.

2. නීති විරෝධි යෝජනා ක්‍රමවල මූලික ලක්ෂණ පහත පරිදි වේ.

( i) යෝජනා ක්‍රමයේ ස්වභාවය - මෙම යෝජනා ක්‍රමයට අලුතින් සම්බන්ධ වන්නන් බඳවා ගන්නා අවස්ථාවේදී භාණ්ඩ හා සේවා මිලදී ගැනීම මගින් මුදල් ආයෝජනය කිරීමට සිදුවන අතර, ඉන්පසු ඔවුන්ට ද එම භාණ්ඩ හා සේවා අලෙවි කිරීම මගින් එම යෝජනා ක්‍රමයට නව සාමාජිකයින් ඇතුළත් කර ගැනීමට සිදුවේ.

( ii) මෙම යෝජනා ක්‍රම යටතේ ඉදිරිපත් කරනු ලබන භණ්ඩ හා සේවාවල අලෙවි කිරීමේ හැකියාව - මෙම භාණ්ඩ හා සේවාවන්වලට වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් නැති අතර, සාමාන්‍යයෙන් ප්‍රවර්ධකයන් මාර්ගයෙන් පමණක් ලබාගත හැකිය.

( iii) ඉහළ ඇතුළත්වීමේ ගාස්තුව - යෝජනා ක්‍රමයට ඇතුළත්වීමේ ගාස්තුව බොහෝවිට ඉහළය. එය ප්‍රවර්ධකයා විසින් ඉදිරිපත් කරනු ලබන භාණ්ඩයේ හෝ සේවාවේ මිල වශයෙන් ද අය කළ හැකිය.

( iv) ද්විතීයික වෙළෙඳපොළ හා අලෙවියෙන් පසු සේවා - මෙම භාණ්ඩවලට ද්විතීයික වෙළෙඳපොළක් නොමැති අතර, අලෙවියෙන් පසු සේවා ලබාදීම පිළිබඳව කිසිම වගකීමක් ප්‍රවර්ධකයා විසින් ලබාදෙනු නොලැබේ.

( v) මූල්‍යමය ප්‍රතිලාභ - සහභාගිවන්නන් විසින් සතය වශයෙන් අලෙවි කරනු ලබන භාණ්ඩ හා සේවා ප්‍රමාණය මත කොමිස් මුදලක් නොගෙවනු ලබන අතර, වැඩි වැඩියෙන් නව සාමාජිකයින් බඳවා ගැනීමට උපදෙස් දෙනු ලැබේ. මූල්‍ය ප්‍රතිලාභය තීරණය වන්නේ එසේ එකතු වන නව සාමාජිකයින් සංඛ්‍යාව මතය.

( vi) ආපසු මිලදී ගැනීමේ ප්‍රතිපත්තිය - තම සාමාජිකත්වයෙන් ඉවත් වන සාමාජිකයෙකු අත ඉතිරි වන භාණ්ඩ තොග නැවත විකිණිය හැකි තත්ත්වයේ පැවතිය ද ඒවා ආපසු මිලදී ගැනීමේ ප්‍රතිපත්තියක් නොමැත.

( vii) භාණ්ඩ විකිණීමේදී අවධානය - භාණ්ඩ හා සේවා අවසාන පාරිභෝගිකයාට සිල්ලර වශයෙන් විකිණීම පිළිබඳව අවධානය අඩු අතර, ප්‍රධාන අරමුණ වන්නේ භාණ්ඩ හා සේවා අලෙවි කිරීම මගින් වැඩි වැඩියෙන් නව සාමාජිකයින් බඳවා ගැනීමයි.

( viii) යෝජනා ක්‍රමය පිළිබඳ තොරතුරු - සාමාන්‍යයෙන් සමාගමේ පිහිටීම, ලිපිනය හෝ දුරකථන අංක වැනි තොරතුරු, ප්‍රවර්ධකයා හෝ ප්‍රවර්ධක ලියකියවිලි මගින් හෙළිදරව් නොකෙරේ.

( ix) අසාමාන්‍ය ඉපයුම් පිළිබඳ ව්‍යාජ පොරොන්දු - ප්‍රවර්ධකයා හෝ ප්‍රවර්ධක ලියකියවිලි මගින් අසාමාන්‍ය ඉපයුම් පිළිබඳව ව්‍යාජ පොරොන්දු (උදාහරණ: "නිත්‍යානුකූලව මසකට රු. 100,000/- ක් උපයන්න" "හෝ ප්‍රීතිමත් හා සෞභාග්‍යමත් ජීවිතයක් ", "නව බෙදාහරින්නන් බඳවා ගැනීම පහසුය" යනාදී ව්‍යාජ ප්‍රතිලාභ ඉදිරිපත් කෙරේ.

( x) කඩිනමින් යෝජනා ක්‍රමයට සම්බන්ධකර ගැනීම - සාමාන්‍යයෙන් ප්‍රවර්ධනකයන් භාණ්ඩය/සේවාව හෝ සමාගම පිළිබඳව සියලු විස්තර ලබාගැනීමට ප්‍රමාණවත් කාලයක් ලබා නොදී ඉක්මනින් ගිවිසුම්වලට එළඹීම සඳහා නව සාමාජිකයින්ට බල කරනු ලැබේ.

( xi) පුහුණුව සහ අලෙවියෙන් පළමු සහාය - ප්‍රවර්ධකයා තමන් විසින් බඳවා ගත් අයට විකුණුම් හා බඳවා ගැනීම් පිළිබඳව විධිමත්, අඛණ්ඩ පුහුණු අවස්ථාවන් ලබා නොදේ.

( xii) යෝජනා ක්‍රමයේ අනාගතය - යෝජනා ක්‍රමයේ පහළම මට්ටමේ නව සාමාජිකයින්ට අලුතින් පුද්ගලයින් බඳවා ගැනීමට නොහැකි වූ විට ඔවුනට තම ආයෝජනය අහිමි වන අතර, යෝජනා ක්‍රමය බිඳ වැටෙයි.

( xiii) සාධාරණ හෝ තර්කානුකූල සීමාවකින් තොරව ඕනෑම ප්‍රදේශයක සාමාජිකයින් බඳවා ගැනීම - මෙම යෝජනා ක්‍රම ක්‍රියාත්මක වන ප්‍රදේශ, කලාප හෝ බල ප්‍රදේශ පිළිබඳව තර්කානුකූල සැලැස්මක් නොමැති අතර, සාමාන්‍යයෙන් ප්‍රවර්ධකයන් විසින් සාධාරණ හෝ තර්කානුකූල සමාවන්ගෙන් තොරව බඳවා ගන්නන් සංඛ්‍යාව ඉහළ නැංවීමට සාමාජිකයින් පොළඹවනු ලැබේ.


බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
30. ජනාධිපති මාවත
කොළඹ 01.
Tel. 0112477100, Fax : 0112477711,
E-mail: banksup@cbsl.lk

## 3. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය සහ අධීක්ෂණය කරනු ලබන මූල්‍ය ආයතන

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පහත සඳහන් ආයතන නියාමනය හා අධීක්ෂණය කරන බව මහජනතාව වෙත මෙයින් දැනුම්දෙනු ලැබේ.

බලපත්‍රලාභී බැංකු, ලියාපදිංචි මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සහ රජයේ සුරැකුම් පත් පිළිබඳ ප්‍රාථමික අලෙවිකරුවන් සම්බන්ධයෙන් නීතියෙහි දක්වා ඇති පරිදි නිරන්තරයෙන් සුදුසු නියාමන ක්‍රියා මාර්ග ගනු ලබන බව ශ්‍රී ලංකා මහ බැංකුව නැවත අවධාරණය කරයි.

ඒ අනුව, මහජනතාවට තමන්ගේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු කිසිම බාධාවකින් තොරව මෙම ආයතන සමග පවත්වාගෙන යාහැකි බව ශ්‍රී ලංකා මහ බැංකුව මෙයින් දන්වා සිටී.

### බලපත්‍රලාභී වාණිජ බැංකු

1. අයිසීඅයිසීඅයි බැන්ක් ලිමිටඩ්
2. ඉන්දියන් ඕවර්සීස් බැංකුව
3. ඉන්දියන් බැංකුව
4. එම්සීබී බැන්ක් ලිමිටඩ්
5. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී
6. ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් ලිමිටඩ්
7. ඩොයිෂ් බැංකුව ඒ.ජී
8. ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්
9. නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී
10. නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී
11. පබ්ලික් බැන්ක් බර්හාඩ්
12. පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී
13. මහජන බැංකුව
14. යුනියන් බැන්ක් ඔෆ් කලම්බු ලිමිටඩ්
15. ලංකා බැංකුව
16. සම්පත් බැන්ක් පීඑල්සී
17. සිටි බැන්ක් එන්.ඒ.
18. සෙලාන් බැන්ක් පීඑල්සී
19. ස්ටැන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුව
20. ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා
21. හබීබ් බැන්ක් ලිමිටඩ්
22. හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී

### බලපත්‍රලාභී විශේෂිත බැංකු

1. ඌව සංවර්ධන බැංකුව
2. කඳුරට සංවර්ධන බැංකුව
3. ජාතික ඉතිරිකිරීමේ බැංකුව
4. ඩීඑෆ්සීසී බැංකුව
5. රජරට සංවර්ධන බැංකුව
6. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
7. රුහුණ සංවර්ධන බැංකුව
8. වයඹ සංවර්ධන බැංකුව
9. සබරගමුව සංවර්ධන බැංකුව
10. සෙලින්කෝ සේවින්ග්ස් බැන්ක් ලිමිටඩ්
11. සීමාසහිත ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව
12. සීමාසහිත සණස සංවර්ධන බැංකුව
13. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
14. ශ්‍රී ලංකා සේවින්ග්ස් බැන්ක් ලිමිටඩ්

### ලියාපදිංචි මුදල් සමාගම්

1. අබාන්ස් ෆයිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ්
2. ආර්පිකෝ ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
3. ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
4. ඉන්ඩස්ට්‍රියල් ෆිනෑන්ස් ලිමිටඩ්
5. එදිරිසිංහ ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිඩට්
6. එලයන්ස් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
7. එල්.බී ෆිනෑන්ස් පීඑල්සී
8. ඒ.එම්.ඩබ්.කැපිටල් ලීසිං ලිමිටඩ්
9. ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් ලිමිටඩ්
10. ඒෂියන් ෆිනෑන්ස් ලිමිටඩ්
11. කැපිටල් රීච් ලීසිං ලිමිටඩ්
12. කොමර්ෂල් ක්‍රෙඩිට් ලිමිටඩ්
13. චිලව් ෆිනෑන්ස් ලිමිටඩ්
14. ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
15. ද මල්ටි ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
16. ද ෆිනෑන්ස් ඇන්ඩ් ගරන්ටි කම්පැනි ලිමිටඩ්
17. ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
18. නන්දා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
19. නෙක්ස්ට්ෆිනෑන්ස් ලිමිටඩ් (කලින් ජනශක්ති ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්)
20. බාට්ලිට් ෆිනෑන්ස් ලිමිටඩ්
21. බිම්පුත් ලංකා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
22. මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
23. මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්
24. ලංකා ඔරික්ස් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
25. වැලිබල් ෆිනෑන්ස් ලිමිටඩ්
26. සිල්වරීන් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
27. සිංගර් ෆිනෑන්ස් (ලංකා) ලිමිටඩ්
28. සෙන්කඩගල ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
29. සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් ලිමිටඩ්
30. සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
31. සෙලාන් මර්චන්ට් ලීසිං පීඑල්සී
32. සෙලින්කෝ ඉන්වෙස්ට්මන්ට්ස්ඇන්ඩ් රියලිටි ලිමිටඩ්
33. ස්වර්ණමහල් ෆනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ්
34. සිංහපුත්‍ර ෆිනෑන්ස් ලිමිටඩ්

### විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්

1. ඇසෙට්ලයින් ලීසිං කම්පැනි ලිමිටඩ්
2. ඉන්ද්‍රා ෆිනෑන්ස් ලිමිටඩ්
3. ඉසුරු ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
4. එල් ඕ එල් සී මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටඩ්
5. ඒසියා කොමර්ස් ලිමිටඩ්
6. ඔරියන්ට් ෆිනෑන්ෂියල් සර්විසස් කෝපරේෂන් ලිමිටඩ්
7. කළුතොට ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ලීසිං ලිමිටඩ්
8. කැපිටල් රීච් ක්‍රෙඩිට් ලිමිටඩ්
9. කොමර්ෂල් ලීසිං කම්පැනි පීඑල්සී
10. කොෂිබා ලීසිං කම්පැනි ලිමිටඩ්
11. කෝපරේටිව් ලීසිං කම්පැනි ලිමිටඩ්
12. පීපල්ස් මර්චන්ට් බැන්ක් පීඑල්සී
13. පීපල්ස් ලීසිං කම්පැනි ලිමිටඩ්
14. මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී
15. ලංකා ඔරික්ස් ලීසිං කම්පැනි පීඑල්සී
16. ලිස්වින් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
17. සම්පත් ලීසිං ඇන්ඩ් ෆැක්ටරිං ලිමිටඩ්
18. සිලීස් ෆිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ්
19. සෙලාන් මර්චන්ට් බැන්ක් පීඑල්සී
20. සෙලින්කෝ ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්
21. සෙලින්කෝ ලීසිං කෝපරේෂන් ලිමිටඩ්
22. සෙලින්කෝ ෆයිනෑන්ස් පීඑල්සී

### ප්‍රාථමික අලෙවිකරුවන්ගේ නම්

1. එච්.එන්.බී.සෙකියුරිටීස් ලිමිටඩ්
2. එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් කොම්පැනි ලිමිටඩ්
3. කැපිටල් එලයන්ස් ලිමිටඩ්
4. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී ප්‍රාථමික වෙළෙඳ ඒකකය
5. නැට්වෙල්ත් සෙකියුරිටීස් ලිමිටඩ්
6. ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් ලිමිටඩ්
7. මහජන බැංකුව - ප්‍රාථමික වෙළෙඳ ඒකකය
8. ලංකා බැංකුව - ප්‍රාථමික වෙළෙඳ ඒකකය
9. සම්පත් සුරැකුම් ලිමිටඩ්
10. සෙලින්කෝ ශ්‍රීරාම් සෙකියුරිටීස් ලිමිටඩ්
11. සෙලාන් බැන්ක් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්


**ශ්‍රී ලංකා මහ බැංකුව,**
**අංක 30, ජනාධිපති මාවත,**
**කොළඹ 01.**

දුරකථන - 2477000, 2440330, 2330220
විද්‍යුත් තැපැල : **cbslgen@cbsl.lk web site : www.cbsl.gov.lk**

## සංඛ්‍යා ලේඛන සටහන්

### විග්‍රහයන් හා විස්තර සටහන්

පහත දැක්වෙන පොදු සටහන්, එක් එක් සංඛ්‍යා සටහනෙහි අධෝ ලිපිවලට පරිපූරක වෙයි.

1. විවරණිකාව මුද්‍රණය වන අවස්ථා වනවිට ලැබී ඇති මාසික සංඛ්‍යා දක්වා ඇත. සෑම සංඛ්‍යා සට හනකම දක්වා ඇති අළුත්ම තොරතුරු එම මාසයම සඳහා නොවන්නට පුළුවන.

   සංසන්දනය සඳහා, මෑත අවුරුදුවල වාර්ෂික සංඛ්‍යාවන් දැක්වේ.

2. සම්පූර්ණත්වය සඳහා සමහර සංඛ්‍යා සටහන්වල, තාවකාලික සංඛ්‍යාවන් ඇතුළත් කොට ඇත.

3. සමහර සංඛ්‍යා සටහන්වල සංඛ්‍යාවන් ආසන්න සංඛ්‍යාවට දක්වා ඇත. එබැවින් දක්වා ඇති එකතුවෙහිත්
   සංඛ්‍යා එකතු කළ විට ලැබෙන එකතුවෙහිත් සුළු වෙනස්කම් තිබෙන්නට පුළුවන.

4. කලින් පළ කොට ඇති සංඛ්‍යාවන් වෙනස් වන්නේ, පසුව කළ සංශෝධනයන් නිසාය.

5. පහත දැක්වෙන සංකේතයන් යොදා ඇත.

| | | |
|---|---|---|
| ලැ.නො. | = | ලැබී නොමැත. |
| - | = | කිසිවක් නැත. |
| - | = | සැලකිය යුතු නොවේ. |